# අනුරාධපුර සහ පොළොන්නරු යුගවලදී භාවිත කළ රෝග ප්‍රතිෂේධ සහ ව්‍යාපශමනොපක්‍රමයන්හි සංවිධානය හා පැවැත්ම පිළිබඳ අධ්‍යයනයක්

කොළඹ විශ්වවිද්‍යාලයේ
ආයුර්වේද දර්ශනපති (M Phil)
උපාධිය සඳහා ඉදිරිපත් කරන
පර්යේෂණ නිබන්ධනය


**ජී. ඩබ්ලිව් ආරියදාස**

බී. ඒ. එම්. එස්. ගෞරව ( ලංකා )

එල්. එල්. බී. ( ශ්‍රී ලංකා )

<u>උපදේශක</u>
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,
ආර්. එම්. පී. රත්වල
බී. ඒ. එම්. එස්. (ලංකා), එච්. පී. ඒ. (ලංකා)
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ( 1 වන ශ්‍රේණිය )
දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය,
කොළඹ විශ්වවිද්‍යාලය.

<u>සහාය උපදේශක</u>
මහාචාර්ය පී. එල්. ප්‍රේමතිලක
බී. ඒ. (ලංකා) ; එම්. ඒ.(කල්කටා)
පී. එච්. ඩී. (ලන්ඩන්)
හිටපු මහාචාර් ය
පේරාදෙණිය විශ්වවිද්‍යාලය.

මෞලික සිද්ධාන්ත දෙපාර්තමේන්තුව
දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය
කොළඹ විශ්ව විද්‍යාලය
රාජගිරිය
ශ්‍රී ලංකාව.


1995

93/004

## වියුක්ත සාරාංශය

## ABSTRACT

අනුරාධපුර හා පොළොන්නරු යුගවල රෝග ප්‍රතිෂේධෝපක්‍රම මෙන් ම රෝග ව්‍යපශම-නෝපක්‍රම ද විධිමත් පරිදි ක්‍රියාත්මක වී ඇතත්, ඒ පිළිබඳ ව අප සමාජයට තිබූ දැනුම අල්ප විය. මෙම පර්යේෂණය මගින් එම අඩුව සම්පූර්ණ කිරීමට හැකියාව ලැබෙනු ඇත. මෙය වෛද්‍ය ශිෂ්‍යයින්ට මෙන් ම පර්යේෂකයින්ට ද ආධාරකයක් වනු නො අනුමාන ය. පර්යේෂණය සිදු කිරීමේ දී වූ විමර්ශනයක යෙදීමට සිදු විය. පෞරාණික සෙල්ලිපි මහාවංශය ඇතුළු පෞරාණික තොරතුරු සහිත ඉතිහාස ග්‍රන්ථ සහ පෞරාණික නටබුන් ද මෙම විමර්ශනයට හසු විය. ඉන් අනතුරුව ඉතිහාසය හා පුරාවිද්‍යාව පිළිබඳ විශාරදයන්ගේ ද උපදෙස් පරිදි ඉහත සඳහන් මූලාශ්‍රවල පවත්නා කරුණු තහවුරු කර ගැනීම සඳහා කටයුතු කරන ලදී. මේවා බොහෝ විට තහවුරු වූයේ දැනට අනුරාධපුර හා පොළොන්නරු ප්‍රදේශවල පවත්නා පෞරාණික නටබුන් වලින් සහ සාරාර්ථ සංග්‍රහය වැනි ග්‍රන්ථ වල අඩංගු වූ වෛද්‍යමය තොරතුරු නිසා ය. මෙම තොරතුරු තහවුරු කිරීමේ කාර්යයේ දී අනුරාධපුරය හා පොළොන්නරුව ප්‍රදේශ වල කිහිප වරක් සංචාරය කරන ලදී. කොළඹ කෞතුකාගාරය සහ ඉහත ප්‍රදේශ වල සියළුම කෞතුකාගාරයන්හි සමීක්ෂණයක යෙදීමට සිදුවූ අතර, පුස්තකාල කිහිපයකදී අදාළ ග්‍රන්ථ පරිශීලනය කෙරිණි. මෙම පර්යේෂණ-යේ දී එළිදරව් වූ එක් කරුණක් නම්, අනුරාධපුර යුගයේ දී පවා ඉන්දියාවේ ආයුර්වේදයෙහි බලපෑම් අප රටට ඇතිවී තිබූ බව ය. එසේම විධිමත් වූ වෛද්‍ය ක්‍රම අනුරාධපුර හා පොළොන්නරු යුගවල අප රටෙහි ක්‍රියාත්මක වී බව පෙනී ගියේ ය. වර්තමානයේ මෙන් ම එකල ද රෝගයන් ඒ ඒ අංශ වලට වර්ගීකරණය කර තිබූ බව පැහැදිලි ය. උදා : ළමා රෝග, ප්‍රසූති හා ස්ත්‍රී රෝග යනාදී වශයෙනි. වර්තමානයේ ලංකාවේ ක්‍රියාත්මක වන වෛද්‍ය ක්‍රම වල අඩංගු සියලුම අංගයන් පාහේ එම යුගවල ක්‍රියාත්මක වූ බැව් කිව හැකි ය. පර්යේ-ෂණයෙන් පසුව ඊට අදාළව ඉදිරිපත් කෙරෙන මෙම නිබන්ධනය අපගේ ප්‍රකාශනයෙන් ද පර්යේෂණයේදී උපකාර කළ විවිධ අයට කරන ලද ස්තුතියෙන් ද, අරමුණු වලින් ද සාහිත්‍ය සමාලෝචනයෙන් ද, නිරීක්ෂණ වලින් ද, සාකච්ඡාවෙන් ද, සාරාංශය හා නිගමන වලින් ද, ක්‍රමවේදයෙන් ද, සාරාංශයකින් ද සමන්විත වේ. ඊට අමතරව රෝග ප්‍රතිෂේධෝපක්‍රම, රෝග ව්‍යපශමනෝපක්‍රම, සංවිධානය හා එකල පැවති ප්‍රතිකාර විධි වලින් යුත් පරිච්ඡේද කොටසක් වෙන් කර ඇත. එකල පැවති ප්‍රතිකාර විධි පිළිබඳව දැනුම ලබා ගැනීම සඳහා බෙහෙ-වින්ම උපකාරී වූයේ බුද්ධදාස රජතුමන් විසින් කරවන ලදැයි සැළකෙන වෛද්‍යක සාරාර්ථ

සංග්‍රහයයි. පොළොන්නරු යුගයේ ලියැවුණු වෛද්‍ය ග්‍රන්ථ වර්තමානයේ දක්නට නොමැති බැවින්, ඊළඟ පාලන යුගය වන දඹදෙණි යුගයේ ලියැවුණු වෛද්‍ය ග්‍රන්ථ උපයෝගී කර ගැනිනි. මෙහිදී වැඩිපුරම භාවිත වූයේ යෝගාර්ණවය, යෝගරත්නාකරය, වරයෝග සාරය යන ග්‍රන්ථයන්ය. අනුරාධපුර යුගයේත් දඹදෙණි යුගයේත් භාවිත වූ වෛද්‍යක්‍රම ඒ දෙක අතර වූ පොළොන්නරු යුගයේත් භාවිත වූ බව උපකල්පනය කරන ලදි. මෙම පර්යේෂණයේ දී ලබාගත් නිරීක්ෂණයන් හා උපකල්පනයන් ඒ ඒ මාතෘකා යටතේ ම දක්වා ඇත. මෙවැනි උපකල්පනයන් ඉදිරිපත් කර ඇත්තේ ඉතා පැහැදිලි සාධක පවත්නා අවස්ථා වල පමණි. ඒ ඒ පරිච්ඡේද වලට එහි අංගයන් වර්ගීකරණය කොට සටහන් තුනක් මගින් ඉදිරිපත් කොට ඇත. සරල වූත්, සංක්ෂිප්ත වූත් අධ්‍යයනයක දී මෙම ගැලීම් සටහන් කියවීමෙන් පමණක් සමස්ත පර්යේෂණය පිළිබඳව ම දැනුමක් ඇති කර ගැනීමට හැකියාව ලැබෙනු ඇත. මෙම නිබන්ධනය පරිශීලන-යේදී ආයුර්වේදය යනු කුමක්ද? යන්න පිළිබඳව පැහැදිලි අවබෝධයක් ලබා ගැනීමට හැකිවනු පිණිස එහි ස්වභාවය හා අංග අට පිළිබඳව විස්තරයක් හැඳින්වීමෙහි ඇතුළත් කරන ලදි. පුරාණ ලංකාවේ අදාළ යුගවල භාවිත වූ වෛද්‍ය ක්‍රමයන් උපයෝගී කර ගන්නා ලද්දේ අංගයෙන් අංගය වෙන්කර ගැනීමෙන් පසුව බව අෂ්ටාංගායුර්වේදය වර්ගීකරණය කර ඇති ආකාරයෙන් මනාවට පැහැදිලි වේ. එකල ලංකාවේ මහජන රෝග ප්‍රතිෂේධක්‍රම ද, ආයතනික රෝග ප්‍රතිෂේධක්‍රම ද පෞද්ගලික රෝග ප්‍රතිෂේධ ක්‍රම ද භාවිත වී ඇත. රෝග ව්‍යපශමන විධි මිනිසුන් කෙරෙහි මෙන් ම සතුන් කෙරෙහි ද යෙදවූ බවට ප්‍රබල සාධක ඇත. එසේම රෝග ප්‍රතිකර්මයෙහි ලා ආයතනික සේවා මෙන් ම, ජංගම සේවාවන් ද ක්‍රියාත්මක වී ඇත. තවද, ඖෂධ ව්‍යපශමන විධි මෙන් ම, ශල්‍ය ව්‍යපශමන විධි ද අද්‍රව්‍ය ව්‍යපශමන විධි ද එකල භාවිත වී ඇත. අද්‍රව්‍ය ව්‍යපශමන විධි යනු, කිසිඳු ද්‍රව්‍යයක් ප්‍රයෝජනයට නොගෙන කරනු ලබන යන්ත්‍ර මන්ත්‍ර, කෙම් සහ ආගමික උවටැන් ය. එකල සුවසේවා ව්‍යුහය රෝහල් වැනි ආයතනික වෛද්‍ය සේවා, ජංගම වෛද්‍ය සේවා, අතුරු වෛද්‍ය සේවා, පෞද්ගලික වෛද්‍ය සේවා සහ වෛද්‍ය අධ්‍යාපනය යන අංගයන්ගෙන් සමන්විත වූ බැව් පෙනේ. රෝහල් විවිධා-කාරයෙන් වර්ගීකරණය වූ අතර, ඒවායේ පැවැත්ම සඳහා විවිධ ආචාර ධර්ම ද පනවා තිබුණි. එකල පැවති චිකිත්සා විධි ඉතා විද්‍යානුකූලව වර්ගීකරණය කර තිබීම අගය කළ යුතු ය. එය වර්තමාන වර්ගීකරණය තරමට ම දියුණු නැතත්, එයට බොහෝ සේ සමීප ක්‍රමයෙකැයි කිව හැකි ය. එම චිකිත්සා විධි කාය චිකිත්සා, ශල්‍ය චිකිත්සා, ශල්‍යකර්ම චිකිත්සා, ද්‍රව්‍ය ගණ චිකිත්සා, අන්නපාන චිකිත්සා සහ මානසික චිකිත්සා යනුවෙන් වර්ගීකරණය කර ඇති අතර, ඒ ඒ

චිකිත්සාංගයන් සඳහා උපාංගයන් ද එවැනි ම ශාස්ත්‍රීය පදනමක් යටතේ විස්තර කර ඇත. මේ අනුව, සලකා බැලීමේදී අනුරාධපුර හා පොළොන්නරු යුගයයන්හි විධිමත් වූ ශාස්ත්‍රීය චිකිත්සා පද්ධතියක් මෙන් ම මනා යෞධය සේවාවක් ද ක්‍රියාත්මක වූ බැව් කිව හැකි ය.